# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 937 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 03/06/2024<br>පැය 1730 |

# මාධ්‍ය නිවේදනය

## බස් රථයක් දුම්රිය මාර්ගයක ධාවනය කළ රියදුරු බන්ධනාගාර ගත කිරීම. - අවිස්සාවේල්ල පොලිස් ස්ථානය.

2024.06.02 වන දින උදෑසන කාලයේ කොළඹ රත්නපුර මාර්ගයේ තුම්මෝදර ප්‍රදේශයේ රථවාහන තදබදය පවතින අවස්ථාවකදී අන්තරාදායක ලෙස මගී ප්‍රවාහන පුද්ගලික බස් රථයක් දුම්රිය මාර්ගයක ධාවනය කරවන ලද අතර මෙලෙස අනාරක්ෂිත ලෙස ධාවනය කරන ලද බස් රථයේ රියදුරු ඇඹිලිපිටිය පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අවිස්සාවේල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලදි.

අවිස්සාවේල්ල පොලිසිය මගින් සැකකාර රියදුරු **මිනී මැරිමට තැත් කිරිම, රියදුරු බලපත්‍රය අත්හිටුවා තිබියදී රිය ධාවනය කිරීම, විෂ මත්ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය හා රජයේ දේපල වලට අලහභානි කිරීම යන චෝදනා** යටතේ අවිස්සාවේල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.06.14 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලදි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**